# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ශ්‍රී ලංකා ඖෂධ විද්‍යා සංගමය
## (සංස්ථාගත කිරීමේ)

**ශ්‍රී ලංකා ඖෂධ විද්‍යා සංගමය සංස්ථාගත කිරීම**
**සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

ගාල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා විසින්
2015 නොවැම්බර් මස 27 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2015 නොවැම්බර් මස 02 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[25 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 8.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

2—PL 009450—225(2015/11)

## ශ්‍රී ලංකා ඖෂධ විද්‍යා සංගමය
## (සංස්ථාගත කිරීමේ)

### ශ්‍රී ලංකා ඖෂධ විද්‍යා සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

“ශ්‍රී ලංකා ඖෂධ විද්‍යා සංගමය” යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක්, එහි සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුකූලව ඖෂධ විද්‍යාවේ සහ එහි සියලු අංශයන්හි නියැලීමේ පොදු උන්නතිය සඳහා මෙන්ම එකී සංගමය සම්බන්ධ සියලු පරමාර්ථ හා කරුණු ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද:

එකී සමිතිය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද ඒ පරමාර්ථ සහ කරුණු මෙතෙක් කල් ඒ සංගමය විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර හා කරගෙන ගොස් ඇති හෙයින් ද, එකී සංගමය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින්ද, එකී ඉල්ලීම ඉෂ්ඨ කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 2015 අංක  දරන ශ්‍රී ලංකා ඖෂධ විද්‍යා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ශ්‍රී ලංකා ඖෂධ විද්‍යා සංගමය සංස්ථාගත කිරීම.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයෙහි සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු “සංගමය” යනුවෙන් හඳුන්වනු ලබන) ශ්‍රී ලංකා ඖෂධ විද්‍යා සංගමයේ දැනට සාමාජිකයන් වන්නා වූ හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවේ සාමාජිකයන් ලෙස මෙහි මින් මතු ඇතුළත් කරගනු ලබන, එවැනි සියලු තැනැත්තන් “ශ්‍රී ලංකා ඖෂධ විද්‍යා සංගමය” යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු “සංස්ථාව” යනුවෙන් හඳුන්වනු ලබන) සංස්ථාවක් විය යුතු අතර, එය විසින් පොදු මුද්‍රාවක් තබා ගැනීමේ සහ පාවිච්චි කිරීමේ ද තම අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඇතිව එකී නාමයෙන් සියලු අධිකරණයන්හි නඩු පැවරීම හා නඩු පවරනු ලැබීම කළ හැකි වන්නේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ කවර පරමාර්ථ අරභයා ද ඒ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) ඖෂධ විද්‍යාව හා එහි භාවිතයන් ශ්‍රී ලංකාව තුළ ප්‍රවර්ධනය කිරීම හා නගා සිටුවීම;

(ආ) රටේ ප්‍රගතිය සහ සංවර්ධනය උදෙසා ඖෂධ භාවිතා කිරීම හා සම්බන්ධ වූ සියලුම කරුණු සම්බන්ධයෙන් රජයට උපදෙස් දීම සහ රාජ්‍ය සංස්ථා, පළාත් පාලන ආයතන සහ අනෙකුත් ආයතනයන්ට උපදේශාත්මක තොරතුරු සැපයීම;

(ඇ) (i) ඖෂධවේදීය ඥාණය පිළිබඳ ප්‍රාරම්භක සන්නිවේදනයන් හා සාකච්ඡා ඉදිරිපත් කිරීම සඳහා සාකච්ඡා මණ්ඩපයක් වශයෙන් කටයුතු කිරීමෙන්;

(ii) පුස්තකාල පිහිටුවා පවත්වාගෙන යාමෙන්;

(iii) ඖෂධවේද වෘත්තීන්ට අදාළ කරුණු ප්‍රකාශයට පත් කිරීමෙන්; සහ

(iv) වෙනත් අයුරින් කටයුතු කිරීමෙන්,

ඖෂධවේදීය ඥානය ලබා ගැනීම, ව්‍යාප්ත කිරීම සහ අන්‍යෝන්‍ය වශයෙන් හුවමාරුව වර්ධනය කිරීම,

(ඈ) ඖෂධ විද්‍යාව පිළිබඳ අධ්‍යාපනය සෑම මට්ටමක දී ම නගා සිටුවීම;

(ඉ) ඖෂධ විද්‍යාවේ මූලික පර්යේෂණයන් නගා සිටුවීම, උනන්දු කිරීම හා රැක බලා ගැනීම;

(ඊ) සාමාජිකත්වය විවිධ ශ්‍රේණීන් සඳහා අපේක්ෂකයන් ඇතුළත් කර ගැනීමේ දී යෝග්‍යතාව තක්සේරු කිරීම;

(උ) සංගමයේ සාමාජිකත්වයේ සෑම ශ්‍රේණියක්ම සඳහා යෝග්‍යතා පරීක්ෂණ පැවැත්වීම හෝ පැවැත්වීම සඳහා කටයුතු කිරීම සහ එවැනි පරීක්ෂණ සඳහා අධ්‍යයන පාඨමාලා නගා සිටුවීම, සැපයීම සහ අනුමත කිරීම;

(ඌ) සංගමය විසින් කලින් කල අවශ්‍ය යයි සලකනු ලබන ඖෂධ විද්‍යාවේ ක්ෂේත්‍රයන් සඳහා ඩිප්ලෝමා සහතික සහ අනෙකුත් විශිෂ්ටතා ප්‍රදානය කිරීම සඳහා පරීක්ෂණ

පැවැත්වීම හෝ පැවැත්වීම සඳහා කටයුතු කිරීම සහ එවැනි පරීක්ෂණ සඳහා අධ්‍යයන පාඨමාලා නියම කිරීම, අනුමත කිරීම හෝ සැපයීම;

(එ) සාමාජිකයන්ගේ වෘත්තීය කටයුතු සහ සාමාන්‍ය හැසිරීම උසස් මට්ටමකින් පවත්වාගෙන යාමට වග බලා ගැනීම;

(ඒ) අනෙකුත් විද්‍යාත්මක හා වෘත්තීය සංවිධාන සමග සහයෝගිතාව තහවුරු කිරීම;

(ඔ) ශ්‍රී ලංකාවේ ඖෂධවේදී වෘත්තියේ තත්ත්වය තහවුරු කිරීම සහ ඉහළ නංවාලීම;

(ඕ) සංගමයේ සියලුම හෝ කුමන හෝ පරමාර්ථයන් සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය වන වෙනත් කුමන හෝ පියවර ගැනීම.

**සංස්ථාවේ සාමාන්‍ය බලතල.**

4. බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ සහ වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද ප්‍රදානයන් හා පරිත්‍යාගයන් ලබා ගැනීමේ සහ එකතු කිරීමේ ද සිය අරමුදල් ආයෝජනය කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සේවක මණ්ඩලය සේවයට ගැනීමේ, සේවයේ නියුක්ත කර ගැනීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ එම පරමාර්ථ අතරින් යම් කිසිවක් උන්නතියට පත් කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය වන හෝ යෝග්‍ය වන කවර ආකාරයේ වුව ද සියලු ක්‍රියා කිරීමෙන්, සියලු කරුණු ඉටු කිරීමේ සහ සියලු දේ කිරීමේත් බලය, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව. සංස්ථාවට ඇත්තේ ය.

**සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.**

5. (1) සංස්ථාවේ කටයුතු සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීති හා අතුරු ව්‍යවස්ථාවලට යටත්ව, සංස්ථාවේ රීති හා අතුරු ව්‍යවස්ථා යටතේ තෝරා පත් කරගනු ලබන පුද්ගලයන්ගෙන් යුත් පාලක සභාවක් විසින් පාලනය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේ දී සංගමයේ නිල දැරූ පාලක සභාව සංස්ථාවේ ප්‍රථම පාලක සභාව විය යුතු ය.

**සංස්ථාවේ රීති හා අතුරු ව්‍යවස්ථා.**

**6.** (1) සංස්ථාව විසින් කලින් කල වාර්ෂික මහා සභා රැස්වීමක දී හෝ විශේෂ මහා සභා රැස්වීමක දී හෝ සාමාජිකත්වයේ අවශ්‍ය වන බහුතරයේ ඡන්දයෙන් සංගමයේ කටයුතු කළමනාකරණය සහ පහත සඳහන් සියලුම කරුණු හෝ කුමන හෝ කරුණක් ඇතුළත්ව එහි අරමුණු ඉෂ්ඨ කර ගැනීම සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සහ අතුරු ව්‍යවස්ථා සම්පාදනය කිරීම සඳහා නීත්‍යානුකූල වන්නේ ය:—

(අ) සාමාජිකයන් වර්ග කිරීම, සාමාජිකයක් ඇතුළත් කර ගැනීම, ඉල්ලා අස්වීම හෝ නෙරපීම;

(ආ) වැටුප් නොලබා සේවය කරනු ලබන නිලධාරීන්, විගණක සහ පාලක සභාවේ සාමාජිකයන් තෝරා පත්කර ගැනීම;

(ඇ) කමිටු පත්කිරීම, සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ හැසිරීම, බලතල කාර්ය සහ කර්තව්‍යයන්;

(ඈ) පාලක සභාවේ රැස්වීම් කැඳවිය යුතු සහ පැවැත්විය යුතු වේලාවල් සහ ස්ථාන, එවැනි රැස්වීම්වලට අදාළ නිවේදන සහ න්‍යාය පත්‍ර, ගණපූරණය, ඒවායේ කටයුතු පවත්වාගෙන යාමට අදාළව අනුගමනය කළයුතු ක්‍රියා පටිපාටිය;

(ඉ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම, එහි අරමුදල්වල භාරකාරත්වය සහ එහි ගිණුම් පවත්වාගෙන යාම සහ විගණනය; සහ

(ඊ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ සංස්ථාවේ පරමාර්ථ මුදුන්පමුණුවා ගැනීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ කවර වුව ද රීතියක් හෝ අතුරු ව්‍යවස්ථාවක් (1) වන උපවගන්තිය යටතේ රීතියක් හෝ අතුරු ව්‍යවස්ථාවක් සාදනු ලැබිය හැකි ආකාරයෙන්ම එවැනිම රැස්වීමක දී සංශෝධනය කිරීම, වෙනස් කිරීම, එකතු කිරීම, හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට හා අතුරු ව්‍යවස්ථාවලට යටත් විය යුතු ය.

**සංගමය විසින් ගෙවිය යුතු සහ සංගමයට අය විය යුතු ණය.**

7. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේ දී සංගමය විසින් ගෙවිය යුතුව තිබුණු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපිත සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට සංගමයට ලැබිය යුතුව තිබුණු සියලු ණය, දායක මුදල් සහ සම්මාදම් මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

**සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.**

8. (1) යම් මිළට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක් හෝ අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් හෝ සංස්ථාව සතු වන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් භාර ගැනීමට හා දැරීමට නීතිය අනුව හැකියාව සහ බලය සංස්ථාවට ඇති අතර, ඒ සියලු දේපළ විකිණීමේ හෝ උකස් කිරීමේ සම්පූර්ණ බලය ඇතිව සංස්ථාවේ තත්කාලයේ වලංගුව පවත්නා රීතිවලට යටත්ව මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය වන මුදල් ණයට ගැනීමට හෝ ලබා ගැනීමට සංස්ථාවට බලය ඇති අතර, එම මුදල් ගෙවීම ස්ථිර කිරීම සඳහා යම් උකස්කර, බැඳුම්කර හෝ ණයකර ඇති කිරීමේ. ලියා අත්සන් කිරීමේ, ප්‍රදානය කිරීමේ සහ නිකුත් කිරීමේ බලය ද සංස්ථාවට ඇත්තේ ය.

(3) සංගමය සතු සියලුම චංචල හා නිශ්චල දේපළ මේ පනත ආරම්භ වන දින සිට සංස්ථාව සතු වන්නේය.

**ගාස්තු සහ දායක මුදල් අයකර ගැනීමේ බලතල.**

9. (අ) සංගමය විසින් පවත්වනු ලබන කිසියම් සම්මන්ත්‍රණයකට, පාඨමාලාවකට හෝ විභාගයකට ඇතුළත් කර ගැනීම සඳහා සංගමය විසින් යුක්තිසහගත යයි සලකනු ලබන එබඳු ගාස්තු;

(ආ) සංගමයේ කවර හෝ සාමාජික පංතියකට පුද්ගලයන් ඇතුළත් කර ගැනීමේ ගාස්තු;

(ආ) සංගමය විසින් කරනු ලබන සේවාවන්ට අදාළව සංගමය විසින් යුක්තිසහගත යයි සළකනු ලබන එබඳු දායක මුදල් සහ ගාස්තු,

අයකර ගැනීමට සංගමයට හැකිවිය යුතු සහ සමත්විය යුතු ය.

**බඳවා ගැනීම සහ ආචාර ධර්මීය ව්‍යවහාර කමිටුව**

**10.** බඳවා ගැනීමේ සහ ආචාර ධර්මීය ව්‍යවහාර කමිටුවක් පත් කිරීම සඳහා සහ ශ්‍රී ලංකාව තුළ ඖෂධවේදී වෘත්තියේ යෙදී සිටින සහ කටයුතු කරන පුද්ගලයන් අතර වෘත්තිය ප්‍රමිතීන් සහ විනය පවත්වාගෙන යාම සඳහා කලින් කලට අවශ්‍ය වන එවැනි වෙනත් පියවර ගැනීම සඳහා සංගමයට බලය තිබිය යුතු ය.

**සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.**

**11.** සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී නැතහොත් පාලක සභාව විසින් ස්ථාවර නියෝග මගින් බලය පවරන ලද දෙදෙනකු ඉදිරිපිට දී හැර, සංස්ථාවේ මුද්‍රාව කවර හෝ සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, ඒ සාමාජිකයන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඒ සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. තව ද ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට බාහිරව විය යුතු ය.

**ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.**

**12.** මෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හා ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

**අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.**

**13.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.